# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1452/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br><br>Date | 20/11/2023<br>පැය 0530 |

## මාධ්‍ය නිවේදනය

**01. සැකකටයුතු මරණයක්- අඟුරුවාතොට පොලිස් වසම.**

2023.11.19 වන දින උදෑසන කාලයේදී අඟුරුවාතොට පොලිස් වසමේ වෙනිවැල්පිටිය ප්‍රදේශයේ කුඹුරු යායක නියරක් මත ලේ ගලමින් තුවාල සහිතව වැටී පුද්ගලයෙකු මියගොස් සිටින බවට අඟුරුවාතොට පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 40ක්වූ වෙනිවැල්පිටිය, හල්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකටයුතු මරණය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අඟුරුවාතොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**02. වෙළඳසැල් හා නිවෙස් බිඳ දේපල සොරකම් කිරීම් රැසකට අවශ්‍යකර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණු දිසා අපරාධ කොට්ඨාසය.**

2023.11.19 වන දින උදෑසන කාලයේ බස්නාහිර පළාත දකුණ දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් මීරිහාන, මහරගම, තලංගම, පිළියන්දල, කහතුඩුව, වැලිකඩ, කඩුවෙල, මාළඹේ, හෝමාගම, කොට්ටාව, අතුරුගිරිය, කැළණිය, හොරණ, අළුබෝමුල්ල, දෙහිවල හා කිරුළපන පොලිස් ස්ථාන වලට වාර්ථා වී තිබූ වෙළඳසැල් හා නිවෙස් බිඳ දේපල සොරකම් කිරීම් රැසකට අවශ්‍යකර සිටි සැකකරුවෙකු වත්තල පොලිස් වසමේ ගාමිණී ගුණසේකර මාවත ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වූ පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචි මෘදුකාංග ඉංජිනේරුවරයෙකු ලෙස රැකියාවක නියුතු අයෙකු වේ.**

සැකකරුගෙන් සිදුකරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීම් වලදී සොරාගන්නා ලද කාර් රථ 03ක්, යතුරුපැදි 05ක්, රන් භාණ්ඩ, පරිඝණක උපාංග, හා නිම් ඇඳුම් තොගයක්

පොලිස් භාරයට ගෙන ඇත. සැකකරු හට නුගේගොඩ හා මාළිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණ මගින් වරෙන්තු 05ක් නිකුත් කර ඇති බවටද අනාවරණය වී ඇත.

සැකකරු සම්බන්ධයෙන් බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පෑලියගොඩ පොලිස් ස්ථානය.**

2023.11.19 වන දින උදෑසන කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ වනවාසල දුම්රියපොල අසලදී පෑලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 900 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක්වූ වනවාසල, කැළණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මත්තේගොඩ පොලිස් ස්ථානය.**

2023.11.19 වන දින සවස් කාලයේ මත්තේගොඩ පොලිස් වසමේ කුඩමාදුව ප්‍රදේශයේදී මත්තේගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41ක්වූ මාකන්දන, පිළියන්දල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මත්තේගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.**

2023.11.19 වන දින රාත්‍රී කාලයේ තලංගම පොලිස් වසමේ කල්ගොඩ, මීමනගොඩ හන්දිය අසලදී තංගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 600 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක්වූ දෙපානම, පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - දොම්පේ පොලිස් වසම.**

2023.11.19 වන දින සවස් කාලයේ දොම්පේ පොලිස් වසමේ දෙමාලගම කටුලන්ද මාර්ගයේ දෙමාලගම ප්‍රදේශයේදී දෙමාලගම දෙස සිට කටුලන්ද දෙසට ධාවනය කරමින් සිටි ත්‍රීරෝද රථයක් මාර්ගයේ වම්පස අයිනේ ගමන් කරමින් සිටි පදිකයෙකුගේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා එම ත්‍රීරෝද රථයෙන්ම දොම්පේ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 62 ක් වූ දෙමාලගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව ත්‍රීරෝද රථයේ රියදුරු රථයද සමඟ පලා ගොස් ඇත. මෘත ශරීරය දොම්පේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ත්‍රීරෝද රථයේ රියදුරු අත්අඩංගුවට ගැනීම සඳහා දොම්පේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - කොස්ගොඩ පොලිස් වසම.

2023.11.19 වන දින උදෑසන කාලයේ කොස්ගොඩ පොලිස් වසමේ ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ බුද්ධගොඩට හැරෙන හන්දිය අසලදී ගාල්ල දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ යතුරුපැදියක් එකවරම මාර්ගය හරහා U හැඩයට හරවා නැවත ගාල්ල දෙසට ගමන් කිරීමට යාමේදී කොළඹ දෙස සිට ගාල්ල දෙසට ධාවනය වෙමින් තිබූ යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ එක් පැදිකරුවෙකු බෙන්තර රෝහලට ඇතුලත් කර ඇති අතර වැඩිදුර ප්‍රතිකාර සඳහා කළුතර නාගොඩ රෝහලට ඇතුලත් කර ඇත.

අනෙක් යතුරුපැදියේ පැදිකරු හා පසුපැදිකාරිය බලපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ දියගම, ගල්පාත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කිරීමට නියමිතව ඇත. කොස්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**